ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026/09/25 — චක්‍රලේඛ අංකය : 80/2026

***බස්නාහිර පළාතේ දිසා බාලදක්ෂ කොමසාරිස්වරුන් වෙත,***

**<u>ජාතික බාලදක්ෂ පෙරදිග තූර්යවාදක කණ්ඩායම ස්ථාපිත කිරීම</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් ප්‍රථම වරට ප්‍රධාන කොමසාරිස් නීතිඥ මනෝජ් නානායක්කාර මහතාගේ සංකල්පයකට අනුව ජාතික බාලදක්ෂ පෙරදිග තූර්යවාදක කණ්ඩායමක් ස්ථාපිත කිරීමට තීරණය කොට ඇත.

එම ජාතික බාලදක්ෂ පෙරදිග තූර්යවාදක කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන් ලෙස බස්නාහිර පලාත තුල පිහිටි දිසාවන්හි ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ සහ බාලදක්ෂ බාලිකාවන් හට අවස්ථාව ලබාදීමට තීරණය කොට ඇත.ඒ අනුව ඔබ දිසාවන් තුල සිටින පහත සුදුසුකම් සපුරා ඇති ජාතික බාලදක්ෂ පෙරදිග තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයෙකු/සාමාජිකාවක ලෙස කටයුතු කිරීමට කැමති ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයන්/බාලදක්ෂ බාලිකාවන් දැනුවත් කරන ලෙසත් මේ සමග එවා ඇති අයදුම්පත්‍රය පුරවා ජාතික මූලස්ථානය වෙත 2026/10/10 වන දිනට පෙර යොමු කිරීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිමි.

**ජාතික බාලදක්ෂ පෙරදිග තූර්යවාදක කණ්ඩායමට ඇතුලත් වීමේ මූලික සුදුසුකම්.**

1. දැනට සක්‍රියව බාලදක්ෂ කටයුතු වල නියැලෙන ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයෙකු/ බාලදක්ෂ බාලිකාවක වීම.
2. තම විද්‍යාලයේ හෝ වෙනත් ආයතනයක හෝ මේ වන විට පෙරදිග තූර්යවාදක කණ්ඩායමක සාමාජිකයෙකු/සාමාජිකාවක ලෙස කටයුතු කිරීම.
3. පෙරදිග තූර්යවාදක කණ්ඩායමකට ඇතුලත් විය යුතු යම් තූර්ය වාදන භාණ්ඩයක් තමා සතුව පවතියි නම් එය අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.
4. ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා සහභාගී වීමට හැකියාව තිබීම.
5. පුහුණුවීම් කටයුතු සඳහා නියම කරනු ලබන දිනවලදී ඒ සඳහා සහභාගී වීමට හැකියාව තිබීම.

**ජාතික බාලදක්ෂ පෙරදිග තූර්ය වාදන කණ්ඩායමට ඇතුලත් කරගැනීමට අපේක්ෂිත අංශ.**

I. තූර්යවාදක කණ්ඩායම් නායක/නායිකා
II. දවුල් වාදනය.
III. තම්මැට්ටම් වාදනය
IV. Base Drum වාදනය
V. බෙරවාදනය
VI. බටනලා වාදනය
VII. හක්ගෙඩි වාදනය

ජාතික බාලදක්ෂ පෙරදිග තූර්යවාදක කණ්ඩායමේ නිත්‍ය සාමාජිකයන් ලෙස තෝරාගන්නා අය අවම වශයෙන් වසරක කාලයක් එහි අඛණ්ඩව සේවය කල යුතු අතර එම බාලදක්ෂයන් සඳහා ජාතික මට්ටමේ පිළිගැනීමක් සහිත සහතික පත්‍රයක් ලබාදෙනු ඇත. එමෙන්ම එම නිත්‍ය සාමාජිකයන් සඳහා නිල ඇඳුමේ පූර්ණ කාලීනව පැලදිය හැකි පදක්කමක් පිරිනැමීමට සැලසුම් කර ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සහය ප්‍රධාන කොමසාරිස් දේශාන් මිලින්ද මහතා (දු.අ. 0771072745/ 0740949343) මගින් විමසීම් සිදුකල හැකිය.

මෙයට
බාලදක්ෂ සේවයේ නියුතු,

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

පිටපත් : 1. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු. ලේකම් සහ ගරු භාණ්ඩාගාරික
2. ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරු